අධිකරණ, බන්ධනාගාර කටයුතු, සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා, අධිකරණ, බන්ධනාගාර කටයුතු, සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වසන්තා පෙරේරා මිය, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයේ (ONUR) සභාපති ජේ. ජේ. රත්නසිරි මහතා, ONUR අධ්‍යක්ෂ ජෙනරාල් දීප්ති ලමාහේවා මහතා, සම්භාවනීය අමුත්තන්, තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන්, සහ මෙරට අනාගතය වන උද්යෝගිමත් තරුණ තරුණියනි:

ලෝකය ජාත්‍යන්තර සාම දිනය සැමරූ දිනයට පසු දා අප රැස්වන මේ අවස්ථාවේ අප සාමය යන සංකල්පය සැමරීමෙන් ඔබ්බට ගොස් එය ක්‍රියාවට නැංවීමට අපට ම අභියෝග කරගනිමු.

ශ්‍රී ලංකාවේ නිදහසෙහි, එමෙන්ම එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් අතර රාජතාන්ත්‍රික සබඳතාවල, එනම් වර්ධනය, අභියෝග සහ අන්‍යෝන්‍ය ගරුත්වය සපිරි හවුල් ගමනක 75 වැනි සංවත්සරය සමරන මේ අවස්ථාව ආවර්ජනයටත් ක්‍රියාත්මකවීමටත් ඉතාම සුදුසු මොහොතක්.

ලෝක නායකයින් මේ සතියේ දී එක්සත් ජාතීන්ගේ මහ සභා රැස්වීම සඳහා නිව් යෝක් නුවර දී හමු වූවා. සාමය ගැන බොහෝ දේ කථා කරනු ලැබුවා. නමුත්, යුක්රේනය කුරිරු අන්දමින් ආක්‍රමණය කිරීමෙන්, සූඩානයේ අර්බුදයෙන් අපට පෙනෙන අන්දමට සාමය කියන්නේ සොයාගැනීම දුෂ්කර දෙයක්. ඉන් අපට අවධාරණය කරන්නේ එක් දිනක සාමය පැවතියත් ඉන් පසු දින වන විට එය අහිමි වී ගොස් නැවතත් යථා තත්වයට පත් කරගැනීමට වසර ගණනාවක් යාමට ඉඩ තිබෙනවා. ලොව වටා තව තවත් ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තර්ජනයට ලක්වන අන්දම අපට පෙනෙනවා. අවබෝධය සහ සාමය ප්‍රවර්ධනය කරනු වෙනුවට අමනාපකම් තමන්ගේ වාසියට යොදාගන්නා අය සහ බිය අවුළුවන්නට කටයුතු කරන අය හේතුවෙන් ඉන් ඇතැම් අභියෝග ඇතිවන්නේ අභ්‍යන්තර වශයෙනුයි.

තමන්ගේ ආධිපත්‍ය පැතිරවීමට වුවමනා නිසා විවිධත්වය සම්බන්ධයෙන් ආරවුල් කරගැනීම වෙනුවට විවිධත්වයෙන් ලැබෙන පොහොසත්බව සමරන, එය වැළඳගන්නා ලෝකයක් පිළිබඳව සිතින් මවාගනිමු.

අනාගතය සඳහා පොදු දැක්මක්, එනම්, විවෘත, නිදහස්, සෞභාග්‍යමත් සහ සුරක්ෂිත ලෝකයක් වෙනුවෙන් එක්සත් ජනපදය තවදුරටත් කැපවී සිටිනවා. එය, පුද්ගලයින් සාමයෙන්, නිදහසේ තමන්ගේ එදිනෙදා ජීවිතය ගත කරන, සහ කලට වේලාවට පවත්වන නිදහස් හා සාධාරණ මැතිවරණ හරහා තමන්ගේම අනාගතය, තම ප්‍රජාවන් සහ රට හැඩගස්වාගැනීමට හැකි ලෝකයක්.

මාගේ රටේත් බෙදීම් සහ සාමයට අභියෝග ඇති වනවා, නමුත් අපි උත්සහ කරන්නේ එය නිහතමානීව පිළිගනිමින් "වඩාත් පරිපූර්ණ ඒකාබද්ධතාවයක්" ඇති කරගැනීම සඳහා ඒවා සම්බන්ධයෙන් කටයුතු

කරන්නටයි. එමෙන්ම, ගෝලීය වශයෙන් අප කරන වැඩ කටයුතුවලදී මේ වැයම් සඳහා අපගේ රාජ්‍ය නොවන සංවිධාන හවුල්කරුවන් ඉතාමත් වැදගත් වනවා.

සමාජ ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන මුලපිරීම (SCORE) වැනි මුලපිරීම් සඳහා USAID හරහා සහය දෙන්නට ලැබීම ගැන එ.ජ. තානාපති කාර්යාලය ආඩම්බර වනවා. අද දින අප කථා කරන තේමාව වන "සාමය සඳහා වන ජාතික ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය" පමණක් නොවේ, SCORE හරහා ඒකාබද්ධ ජාතික අනන්‍යතාවයක් වෙනුවෙන් හඬ නගන්නට, ආර්ථික වර්ධනයට මග පාදන්නට, සහ අපේ ප්‍රජාවන්, විශේෂයෙන්ම  කාන්තාවන්ට සහ තාරුණ්‍යයට සාමයේ ආලෝක කදම්භ බවට පත්වන්නට ඔවුන් සවිබල ගන්වන්නට කටයුතු කරනවා.

දැනට 50 වසරකට පෙර මෙරට එ.ජ. තානාපතිවරයාගේ පුත්‍රයා වශයෙන් ශ්‍රී ලංකාවේ වාසය කර ඇති එ.ජ. සෙනෙට් සභික ක්‍රිස් වැන් හොලන් මහතා ගිය මාසයේ යළි වරක් ශ්‍රී ලංකාවට පැමිණියා. එතුමාත් මමත් මහනුවර වික්ටෝරියා ග්‍රාමීය ධීවර සමිතියේ සාමාජිකයින් හමු වී SCORE හරහා ක්‍රියාත්මක වන මිරිදිය ධීවර ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබුවා. විවිධ ආගමික පසුබිම් සහිත ගම්වැසියන්ගෙන් සමන්විත එම ගම්මානයේ මිරිදිය ධීවර කටයුතු සඳහා SCORE සහය ලබාදෙනවා. ඊට හේතුව ආර්ථික වර්ධන අවස්ථා වටා ප්‍රජාවක් ඒකරාශී කිරීම වැනි විවිධාකාරවලින් සාමය සාක්ෂාත් කරගත හැකි බව අප විශ්වාස කිරීමයි.

ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය, අධිකරණ අමාත්‍යාංශය, සහ බිම් මට්ටමේ නායකයින්  සමගින් SCORE සිදුකරන කටයුතු ප්‍රශංසනීය යි. දශක තුනක් තිස්සේ පැවති යුද්ධයෙන් ඉතුරු වූ දෑ, සිත් පසුබට කරන අන්දමේ ආර්ථික අර්බුදය, සහ සංස්කෘතික හා ආගමික නොඉවසීමේ සිදුවීම් යනාදී දැනට පවතින අභියෝග සම්බන්ධයෙන් කටයුතු කරන්නට අප දරන වැයම් ඉදිරියට පවත්වාගත යුතුයි. ඔරොත්තුදෙනසුළු සහ එකමුතු ශ්‍රී ලංකාවක් සඳහා අපේ සාමූහික කැපවීමක් තිබෙනවා. අධිකරණ අමාත්‍යාංශයේ ශක්තිමත් හවුල්කාරීත්වය නොතිබුණි නම් අපට මේ කටයුතු කිසිවක් සිදුකරන්නට බැහැ, එනිසා අද දින මෙහි පැමිණ සිටින අමාත්‍යතුමාට මාගේ ස්තූතිය පිරිනමනවා.

සිත්ගන්නාසුළු ප්‍රදර්ශන, සිසුන්ගේ දායකත්වය සහිත මේ උත්සවය තුළින් එකමුතු, සාමකාමී සහ සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම සඳහා අප හැමදෙනාම එක්ව වැඩකරන අන්දම විදහා පානවා.

හෙට දිනයේ පෙරමුණ ගන්නේ තරුණ ඔබයි. ඔබ මෙහි සිටිනු දකින්නට ලැබීමෙන් මගේ සිත පෙළඹුම් ලබනවා. දිගින් දිගටම මේ ආඛ්‍යානය සමගින් සම්බන්ධ වන්නට, එයට අභියෝග කරන්නට සහ එය හැඩ ගස්වන්නට මා ඔබව දිරිගන්වනවා. ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය සමරමින් මේ රටේ සෑම අස්සක් මුල්ලක් පාසාම ඔබේ හඬ රැව්පිලිරැව් දෙන බව සහතික කරගන්න. අපි  බොහෝ බලාපොරොත්තු ඇතිව අනාගතය දෙස බලමු. අපි ආර්ථික ස්ථායිතාවය, දේශපාලන ස්ථායිතාවය, සහ නවෝත්පාදනය පිළිබඳව

අපි බලාපොරොත්තු ඇතිකරගනිමු. එමෙන්ම අපි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සහ දූෂණයට එරෙහිව ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධයෙන් මහා බලාපොරොත්තු ඇතිකරගනිමු. සාමකාමී විරෝධතා හරහා වේවා, කලාව තුළින් නැතහොත් සමාජ මාධ්‍ය තුළින් ප්‍රකාශනය හරහා වේවා, ප්‍රකාශනයෙහි නිදහස යන වටිනාකම බිල්ලට දී ස්ථායිතාවය ළඟාකරගන්නට සිදුවිය යුතු නැහැ.

අද දින උත්සවයේ අර්ථය, සහ ජාත්‍යන්තර සාම දිනයේ පොරොන්දුව වැළඳ ගන්නා අප උදාසීන නොවිය යුතු බව අවසාන වශයෙන් මා සඳහන් කරනවා. අප අපට ම සහ එකිනෙකා වෙත අභියෝග කරගනිමු, සාමය වෙනුවෙන් වෙර දරන්නට පමණක් නොව අපගේ ක්‍රියාවන් හරහා එය පිළිබිඹු කරන්නට අභියෝග කරගනිමු. එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨතම ජනාධිපති ආර්යාවක් වන එලිනෝර් රූස්වෙල්ට් මහත්මිය මෙසේ කියා තිබෙනවා: "සාමය ගැන කථා කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. අප එය විශ්වාස කළ යුතුයි. එය විශ්වාස කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ, අප ඒ සඳහා වැඩ කළ යුතුයි."

සාමය කෙරෙහි විශ්වාසය තබමින් ශ්‍රී ලංකාවේ කල්පවත්නා සෞභාග්‍ය වෙනුවෙන් ඒ සම්බන්ධයෙන් ඔබ සමගින් වැඩ කිරීමට අද මා පොරොන්දු වනවා.